ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date. 2023-01-31 |

පැමිණිලි පාර්ශවය : ඩබ්.එස්.එස්. ලක්ෂිත මයා
විරාති, ගිණිගල්,
තංගල්ල.

වගඋත්තර පාර්ශවය : අධ්‍යක්ෂක,
මානව සම්පත් අභිවර්ධන ආයතනය,
කොළඹ විශ්ව විද්‍යාලය, අංක 275,
බෞද්ධාලෝක මාවත,
කොළඹ 07.

<u>පැමිණිලි අංකය : HRC/832/15</u>

ඉහත පැමිණිලිකරු විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, කොළඹ විශ්ව විද්‍යාලයේ මානව සම්පත් අභිවර්ධන ආයතනයේ ඩිජිටල් වීඩියෝ නිෂ්පාදනය සහ මාධ්‍ය තාක්ෂණය පිළිබඳ දෙඅවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව සඳහා 2011 අප්‍රේල් මස ලියාපදිංචි වූ බවත්, වසර දෙකක් තුළ සමාසික තුනක් යටතේ පැවැති දේශණ, ක්ෂේත්‍ර වැඩ කණ්ඩායම් වැඩ වලට සහභාගි වූ බවත්, පළමු හා දෙවන සමාසික පරීක්ෂණ වලට ඉදිරිපත් වුවද ඒවායේ ප්‍රතිඵල මෙතෙක් ලබා නොදුන් බවත්, තුන් වන Semester අවසන් කර පාඨමාලාව අවසන් කරන අවස්ථාවේ අවසන් විභාගය සම්බන්ධව දැනුවත් නොකර මේ වන තෙක් අවසන් විභාගය නොපැවැත් වූ බවත්ය. මෙම ඩිප්ලෝමා පාඨමාලාවට අදාළ විභාග පටිපාටියක් සම්බන්ධව පාඨමාලාව ආරම්භයේ නිසි දැනුවත් කිරීමක් නොකළ බවත්, පාඨමාලාව අරඹා වසර 04කට ආසන්න කාලයක් ගත වී ඇතත්, අදාළ ඩිප්ලෝමා සහතික පත්‍ර ලබා දීමට කටයුතු නොකළ බවත්, සඳහන් කර ඇත.

පෙත්සම්කරු 2015-03-02 වැනි දින මෙම පෙත්සම ඉදිරිපත් කිරීමෙන් ඔහු අවසන් කරන ලද ඩිප්ලෝමා සහතික පත්‍රය ලබා ගැනීම සඳහා මානව හිමිකම් කොමිෂන් සභාවේ සහය ඉල්ලා ඇත.
පෙත්සම්කරු මෙම පෙත්සම සමග ඉදිරිපත් කරන ලද ලේඛන පරීක්ෂා කිරීමේදී පෙනී යන්නේ මෙම පාඨමාලාව සඳහා පාඨමාලා ශාස්තුව වශයෙන් රුපියල් එක්ලක්ෂ පනස්දාහක මුදලක්ද

ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: අංක 14, ආර්. ඒ. ද. මෙල් මාවත කොළඹ -04. / இல. 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு -04. / No. 14, R.A.De Mel Mawatha, Colombo -04.
සභාපති / தவிசாளர் / Chairman: 011- 2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011- 2505541/74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94-11-2505580 / 81 /82
ලේකම් / செயலாளர் / Secretary: 011- 2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

(රු.150,000ක) ගෙවා ඇති බවත්, පාඨමාලාව අතරතුරදී ඔහු ඉතා ඕනැකමින් සහ දක්ෂ ලෙස එකී පාඨමාලා හදාරා පළමු සහ දෙවැනි සමාසික විභාග වලටද පෙනී සිටීමෙන් අනතුරුව අවසන් ව්‍යාපෘතිය සඳහා ද කටයුතු කරමින් සිටි බවත්ය.

මෙම පෙත්සම පිළිබඳව වගඋත්තරකාර පාර්ශවයෙන් වාර්තාවක් කැඳවා ඇති අතර, වගඋත්තරකරු විසින් ඒ සම්බන්ධයෙන් පැහැදිලි වාර්තාවක් ලබා දී නොමැත. ඒ අනුව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටින ලෙස සිතාසි මගින් දැනුවත් කර 2019-12-19 වන දින දෙපාර්ශවයේ සහභාගිත්වයෙන් පරීක්ෂණ සිදු කර ඇත.

එකී පරීක්ෂණයේදී වගඋත්තරකාර අධ්‍යක්ෂක, මානව සම්පත් අභිවර්ධන ආයතනය වෙනුවෙන් පෙනීසිටි නියෝජ්‍ය ලේඛකාධිකාරි සඳහන් කර ඇත්තේ, මෙකී දෙඅවුරුදු ඩිප්ලෝමා පාඨමාලා ආරම්භ වූ අවස්ථාවේ එම පාඨමාලා පිළිබඳ අතුරු නීති හා රෙගුලාසි නොතිබුණු හෙයින් සිසුන්ට සහනයක් වශයෙන් අතුරු නීති සහ රෙගුලාසි සකස් කර තිබූ ඕඩියෝ වීඩියෝ (audio video) නිෂ්පාදන සහ මාධ්‍ය තාක්ෂණ උසස් ඩිප්ලෝමා පාඨමාලාවට අනුයුක්ත වන ලෙස දැන්වූ බවයි. එයට අමතරව ඉහත ගත් තීරණය සමග එකග නොවන්නේ නම් පෙත්සම්කාර සිසුවා විසින් පාඨමාලාව සඳහා ගෙවූ මුදල ආපසු ගෙවීමටද කැමැත්ත පළ කර ඇත.

කෙසේ වෙතත් වගඋත්තරකාර පාර්ශවයේ ඉහත කී තීරණයට පෙත්සම්කාර ශිෂ්‍යයා අකමැති බවත්, ඔහුට අවශ්‍ය වන්නේ ඕඩියෝ වීඩියෝ නිෂ්පාදන හා මාධ්‍ය තාක්ෂණ උසස් ඩිප්ලෝමා පාඨමාලාවට නොව ඔහු ලියාපදිංචි වූ ඩිප්ලෝමා සහතික පාඨමාලාව අවසන් කිරීම බව දන්වා ඇත. එසේම අදාළ ඩිප්ලෝමා පාඨමාලාවේ පළමු සහ දෙවන සමාසික විභාගය සමත් කර අවසන් ව්‍යාපෘතියේ කටයුතු කරමින් සිටියදී වගඋත්තරකාර පාර්ශවය විසින් මෙම පාඨමාලාව නවතා උසස් ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීමට පෙත්සම්කාර ශිෂ්‍යාවගෙන් ඉල්ලීම් කිරීම අසාධාරණ බව පෙත්සම්කාර සිසුවා ප්‍රකාශ කර ඇත.

**නිරීක්ෂණය =:**

මෙම පෙත්සම පිළිබඳ පරීක්ෂණයේදී පෙත්සම්කරුගේ සහ වගඋත්තරකරුගේ කරුණු දැක්වීමෙන් අනතුරුව අනාවරණය වී ඇත්තේ, කොළඹ විශ්ව විද්‍යාලයේ මානව සම්පත් අභිවර්ධන ආයතනය විසින් 2011 වර්ෂයේ ඩිජිටල් වීඩියෝ නිෂ්පාදනය සහ මාධ්‍ය තාක්ෂණ පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව සඳහා අයදුම්පත්‍ර කැඳවා එකී අයදුම්පත්‍රය සමග දන්වා තිබූ නීතිරීතිවලට යටත්ව ශිෂ්‍යයන් බඳවා ගෙන අවුරුදු 02ක කාල සීමාවක් පුරාවටම එකී පාඨමාලාව සඳහා දේශනය පවත්වා විභාගය පවත්වා අන්තිම අවස්ථාවේදී එම පාඨමාලාව විධිමත් නීතිරීති වලට අනුකූලව නොවන බව පවසා එම පාඨමාලාව අවලංගු කර නවත් පාඨමාලාවකට ශිෂ්‍යයන්ව බඳවා ගන්නා ලෙස බලකිරීමක් සිදු කර ඇති බවයි.

කොළඹ විශ්ව විද්‍යාලය වන අධ්‍යාපන ක්ෂේත්‍රයේ නියැලී කටයුතු කරන්නා වූ ආයතනයක් වගකීමකින් කටයුතු කළ යුතු බවත්, මෙවැනි කටයුතු වගකිවයුතු ආයතනයකින් කිසිසෙත්ම බලාපොරොත්තු විය නොහැකි බවත් මෙහිදී වැඩිදුරටත් පෙනි යන කරුණකි. තවද ශිෂ්‍යයන් යම් කිසි අනාගත බලාපොරොත්තු සමග මෙකී පාඨමාලාවට බැදී ඇති අතර, එම පාඨමාලව අතරමැද අවලංගු කිරීම මගින් එම ශිෂ්‍ය කණ්ඩායමේ අරමුණු වලට ද වගඋත්තරකාර ආයතනය විසින් හානියක් සිදු කර ඇති බව අනාවරණය වේ.

පරීක්ෂණයේදී වගඋත්තරකාර පාර්ශවය විසින් ඉදිරිපත් කර ඇති කරුණු අනුව නව උසස් ඩිප්ලෝමා පාඨමාලාවට බැදීමට හෝ පෙත්සම්කාර ශිෂ්‍යා විසින් වගඋත්තරකාර ආයතනයට ගෙවන ලද මුදල ආපසු භාර දීමට කැමැත්ත පළ කර සිටීම තුළ මූල්‍යමය වශයෙන් පෙත්සම්කාර සිසුවාට යම් මට්ටමට සහනයක් ලබා දී තිබුණ ද පෙත්සම්කාර ශිෂ්‍යාගේ පාඨමාලාව සඳහා වැය වූ කාලය නැවත ලබා ගැනීමට හෝ ගණනය කිරීමට නොහැක.

වගඋත්තරකාර පාර්ශවය කළ යුතුව තිබුණේ මෙම ඩිප්ලෝමා පාඨමාලාව නිසි නීතිරීති වලට අනුකූලව සකස් කර නොතිබුණේ නම් එකී පාඨමාලාවට බැදුණු පළමු ශිෂ්‍ය කණ්ඩායමට එම පාඨමාලාව අවසන් කිරීමට අවස්ථාව දී අලුත් කණ්ඩායම් බදවා ගැනීමේදී නිසි නීතිරීති වලට යටත්ව උසස් ඩිප්ලෝමා පාඨමාලාව ආරම්භ කිරීමයි.

කරුණු එසේ හෙයින් මෙම වගඋත්තරකාර ආයතනයේ මෙම ක්‍රියාදාමය තුළ පෙත්සම්කාර ශිෂ්‍යාට අගතියක් සිදු වී ඇති බව මනා ලෙස පැහැදිලි වේ.

**නිගමනය =:**

මේ මොහොත වන විට පෙත්සම්කාර ශිෂ්‍යාගේ දීර්ඝ කාලයක් ගෙවී ඇති අතර, එකී කාලය නැවතත් ඔහුට ලබා ගත නොහැක. වගඋත්තරකාර කොළඹ විශ්ව විද්‍යාලයේ මානව සම්පත් අභිවර්ධන ආයතනයේ මෙම ක්‍රියා කලාපය නිසා මෙම පෙත්සම්කාර ශිෂ්‍යාට අගතියක් සිදු වී ඇති බවට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ නිගමනය වේ. වගඋත්තරකාර ආයතනය පාඨමාලාවක් ආරම්භ කිරීමට පෙර එම පාඨමාලාව පිළිබඳව නීතිරෙගුලාසි සකස් කළ යුතුව තිබුණත්, එකී නීතිරෙගුලාසිවලින් තොරව පාඨමාලාවක් ආරම්භ කර එම පාඨමාලාව සඳහා විධිමත්ම අයදුම්පත්‍ර කැඳවා ශිෂ්‍ය සංඛ්‍යාවක් තෝරා ගැනීමෙන් අනතුරුව එම පාඨමාලාව ආරම්භ කර අධ්‍යාපන කටයුතු සමාසික වශයෙන් අවසන් කර අවසන් ව්‍යාපෘතිය පවා ආරම්භ කර එකී පාඨමාලාව අවලංගු කිරීමට තීරණය කිරීම නීත්‍යානුකූල නොවන අතර, එය වගකීම් විරහිත ක්‍රියාවකි.

එමගින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව තුළ තහවුරු කර ඇති පැමිණිලි පාර්ශවයේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

**නිර්දේශය :-**

ඉහත පරිදි වගඋත්තර පාර්ශවයේ ක්‍රියාකලාපය හේතුවෙන් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මගින් සහතික කොට දී ඇති පැමිණිලි පාර්ශවයේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවට අනාවරණය වී ඇති බැවින්, මෙම පෙත්සම්කරුට ඔහු ප්‍රථමයෙන් ලියාපදිංචි වූ ඩිප්ලෝමා පාඨමාලාව අවසන් කිරීමට අවස්ථාව ලබා දෙන ලෙස වගඋත්තරකාර පාර්ශවයට මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2023.02.28 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

A. Shanmuganathan

අනුසූයා ෂන්මුගනාදන්.
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Ms. Anusuya Shanmuganathan
Commissioner
Human Rights Commissioner of Sri Lanka

ම.හේ නිමල් කරුණාසිරි.
කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Dr. M.H. Nimal Karunasiri
Commissioner
Human Rights Commission of Sri Lanka

B/